# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

කේ.එම්.එච්. සනත් ප්‍රියන්ත
අංක 64, රෝහල පාර,
වව්නියාව

<u>**අභියාචක**</u>

**අභියාචනා අංකය :**
**RTIC Appeal No 693/2022**

**එදිරිව**

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
11 වන මහල, සෙත්සිරිපාය දෙවන අදියර,
බත්තරමුල්ල

<u>**පොදු අධිකාරිය**</u>

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්
4. ඒ.එම් නහියා - අධ්‍යක්ෂ ජනරාල්-පුනරුත්ථාපන (විශ්‍රාමික) - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක සූම් තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වේ.

පොදු අධිකාරිය වෙනුවෙන් සූම් තාක්ෂණය ඔස්සේ අධ්‍යක්ෂ සංවර්ධන (සුලු අපනයන භෝග අංශය) / තොරතුරු නිලධාරි රන්සිළු වටවල මයා සම්බන්ධ වේ.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - 2022.10.13
පොදු අධිකාරිය - 2022.10.04

**විභාග කළ දිනය** : 2022.10.20

**තීරණය කළ දිනය** : 2022.10.20

<u>**තීරණය :**</u>

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2022.01.18 දිනැති තොරතුරු ඉල්ලීම්වලින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

"<u>තොරතුරු ඉල්ලීම 1</u>

1. *ලෝක බැංකු හා ආසියානු සංවර්ධන බැංකු ආධාර ප්‍රමාණයන් ලබාදුන් ව්‍යවසායක තොරතුරු 2015 සිට 2021 වව්නියාව දිස්ත්‍රික්කය*

2. *2020 - 2021 වර්ෂවල ලෝක බැංකු හා ආසියානු සංවර්ධන බැංකු ණය/ආධාර/ප්‍රමාණයන් දුන් ගාල්ල හා නුවරඑළිය දිස්ත්‍රික්ක ව්‍යවසායක තොරතුරු*

3. *මේ සියලුදෙනාගේ නම*
   *ලිපිනය*
   *මුදල/ ව්‍යාපෘතිය කුමක්ද?*
   *දිනය සහ තොරතුරු*

*කාල පරිච්ඡේදය 2015 - 2021*

<u>*තොරතුරු ඉල්ලීම 2*</u>

1. *කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස කටයුතු කරන R.G. රෝහණ ගමගේ යන අයට මේ දක්වා ලබා දී ඇති වැටුප් දීමනා ප්‍රමාණය*

2. *කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස කටයුතු කරන R.G. රෝහණ ගමගේ යන අයට මසකට ලබා දෙන වැටුප් හා දීමනා තොරතුරු*

*කාල පරිච්ඡේදය 2015 – 2021"*

ඒ අනුව, තොරතුරු නිළධාරි පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2022.03.04 දිනැතිව නම්කළ නිළධාරී වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිලධාරි ද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2022.03.24 දිනැතිව කොමිෂන් සභාව වෙත ඉහත අංක දරණ අභියාචනය යොමු කර ඇත.

අභියාචකගේ 2022.01.18 දිනැති තොරතුරු ඉල්ලීමට සහ 2022.03.04 දිනැති අභියාචනයට ප්‍රතිචාර දැක්වීමට පොදු අධිකාරිය අපොහොසත් වී ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත. ඒ අනුව, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි විධිවිධානවලට අනුකූලව, පනත මගින් නිශ්චිතව දක්වා ඇති කාල නියමයන් තුළ පුරවැසියන් විසින් ඉදිරිපත් කරනු ලබන සියලු තොරතුරු ඉල්ලීම් සහ අභියාචනා සඳහා ප්‍රතිචාර දැක්වීමට, පනතෙහි 24 (3) සහ 25 (1) වගන්ති ප්‍රකාරව පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි හට ද, පනතෙහි 31(2) සහ 31(3) වගන්ති ප්‍රකාරව නම්කළ නිලධාරි හට ද පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීම පොදු අධිකාරියේ තොරතුරු නිළධාරි සහ නම්කළ නිළධාරි විසින් පැහැර හැර ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත.

පොදු අධිකාරිය විසින් 2022.10.04 වන දින කොමිෂන් සභාව වෙත ලිපියක් ඉදිරිපත් කරමින් පහත සඳහන් කරුණු කොමිෂන් සභාවේ අවධානයට යොමු කර ඇත.

> *"උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක RTIC/Appeal/693/2022 හා 2022.09.17 දිනැති අභියාචනා විභාගයට අදාල ලිපිය හා බැඳේ.*
>
> *කේ.එම්.ඒච් සනත් ප්‍රියන්ත මහතා කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතියට (ASMP) අදාලව මේ වන විට තොරතුරු ඉල්ලීම් 08ක් ඉදිරිපත් කර ඇත. මෙම තොරතුරු ඉල්ලීම් සැලකීමේදී බොහොමයක් ඉල්ලීම් තොරතුරු ඉල්ලීම් නොවන බවත්, ප්‍රශ්න විමසීම් බවත් නිරීක්ෂණය වේ.*

*එසේම මෙම ඉල්ලීම් හා ඊට අදාලව අමාත්‍යාංශය වෙත වාර්තා වී ඇති කරුණු අනුව නිරීක්ෂණය වනුයේ මෙම තොරතුරු ඉල්ලුම්කරු හා ව්‍යාපෘතිය අධ්‍යක්ෂවරයා අතර මතුවී තිබෙන පෞද්ගලික ගැටීමක් හේතුවෙන් ඉදිරිපත් වන තොරතුරු ඉල්ලීම් බවයි.*

*මෙවැනි ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම අමාත්‍යංශ මණ්ඩලයේ කාලය හා සම්පත් අනවශ්‍ය ලෙස වැය වන බව නිරීක්ෂණය කරමි. එබැවින් මෙවැනි කරුණු පිලිබදව ගතහැකි පියවර සම්බන්ධයෙන් සලකා බැලීම සුදුසු බව ද නිරීක්ෂණය කරමි.*

*උක්ත ව්‍යාපෘතියට අදාලව අප වෙත යොමු කර ඇති සියලු තොරතුරු ඉල්ලීම් වලට අදාලව අභියවක වෙත යොමු කරන ලද පිළිතුරු ලිපියේ පිටපතක්ද මේ සමග අමුණා එවමි."*

අභියාචක විසින් 2022.10.13 වන දින කොමිෂන් සභාව වෙත ලිපියක් ඉදිරිපත් කරමින් පහත සඳහන් කරුණු කොමිෂන් සභාවේ අවධානයට යොමු කර ඇත.

*"ලෝක බැංකුව විසින් කෘෂිකර්ම අංශයෙ අපනයන අදායම ඉහල නැංවීම සඳහා කෘෂිකර්ම නවීන ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇති ණය මුදල ඩොලර් මිලියන 70 (ආසන්න වශයෙන්) කි. එය ශ්‍රී ලංකා මුදලින් කෝටි 2520 (ඩොලරය රු: 360 බැගින් ගණනය කිරීමේදී). ඉහත මුදල් කෘෂි අංශයේ ව්‍යවසායකයන් සඳහා නැවත අය නොකරන ප්‍රදානයන් ලෙස ලබාදේ. පොදු අධිකාරිය සතු මුදල් නොමිලේ ලබාදුන් පුද්ගලයන් පිලිබදව දැනගැනීමට පුරවැසියන්ට අයිතියක් ඇත. අවම වශයෙන් ව්‍යාපෘතිය පිලිබදව ජනතාවට තොරතුරු ලබා දීමට කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතියේ නිලධාරීන් බැඳි සිටිති. නමුත් එයද ඉටු නොකරයි. එය තොරතුරු දැනගැනීමේ පනතේ නීතිරීති උල්ලංඝනය කිරීමකි.*

*එමෙන්ම ලි.ප. තැපෑලෙන් එවන ලද අයදුම්පත්‍රය නොලැබුණු බව කියති. නමුත් එය පිළිගත නොහැකිය. තැපැල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද බ.ප. (2)/06/තො.දැ.ප/1639/2022 මගින් ලි.ප.තැ. 3945 දරන ලිපිය නිවරදි ලෙස භාර දීමට අදාල තොරතුරු සපයා ලිපිය භාරදුන් බවට සනාථ කර ඇත. එම නිසා කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතිය නිලධරිහු තොරතුරු ලබාදීමෙන් මගහැර යාම සඳහා උපක්‍රම යොදන බවද පැහැදිලි වේ. එම නිසා පුරවැසියාගේ තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කරන ලෙස කාරුණිකව ඉල්ලමි."*

## සළකා බැලීම

අභියාචක විසින් ඉදිරිපත් කරන ලද උක්ත තොරතුරු ඉල්ලීමට පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි ප්‍රතිචාර දක්වා නොමැති අතර ඉන් පසුව අභියාචක විසින් ඉදිරිපත් කරන ලද අභියාචනයටද පොදු අධිකාරියේ නම් කළ නිලධාරි විසින් ප්‍රතිචාර දක්වා නොමැත. මෙම තත්වය පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි සහ නම් කළ නිලධාරි විසින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන බරපතල ලෙස උල්ලංඝනය කිරීමකි.

උක්ත පනතේ 24, 25, 27 සහ 28 වන වගන්ති යටතේ තොරතුරු නිලධාරි විසින් තොරතුරු ඉල්ලීමක් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලිව දක්වා තිබියදීත් එකී විධිවිධාන පරිදි ක්‍රියා කළ බවට කරුණු අනාවරණය නොවේ. එසේම, අභියාචනය ඉදිරිපත් කළ පසු නම් කළ නිලධාරි විසින් ක්‍රියා කළ යුතු ආකාරය පනතේ 31 වන වගන්තිය යටතේ පැහැදිලිව දක්වා තිබියදීත් ඒ පිළිබඳව ක්‍රියා කළ බවට කරුණු අනාවරණය නොවේ.

මේ අන්දමින් තොරතුරු පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම් කිසිසේත් සැහැල්ලුවෙන් සැළකීමට කොමිෂන් සභාවට හැකියාවක් නොමැත. එබැවින් පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි සහ නම් කළ නිලධාරි විසින් 2016

අංක 12 දරණ පනතේ විධිවිධාන යථා පරිදි ක්‍රියාවට නැංවීමට අසමත් වන්නේ නම් ඔවුනට එරෙහිව උක්ත සඳහන් පනතේ 38 වන වගන්තිය යටතේ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කොමිෂන් සභාවට සිදු වේ. එබැවින් මින් ඉදිරියට තොරතුරු පනතේ විධිවිධාන උල්ලංඝනය වීම් වළක්වා ගැනීම සඳහා පොදු අධිකාරියෙහි තොරතුරු නිලධාරි සහ නම් කළ නිලධාරි ක්‍රියා කළ යුතු බවට කොමිෂන් සභාව තරයේ අවධාරණය කරයි.

කොමිෂන් සභාව වෙත අභියාචනය ඉදිරිපත් කිරීමෙන් පසු 2022.09.30 දිනැති ඉහත සඳහන් ලිපිය මගින් පොදු අධිකාරිය විසින් අභියාචක වෙත තොරතුරු සැපයීමක් සිදු කර ඇතත්, එම තොරතුරු සැපයීම මගින් මෙම අභියාචනයට අදාළ තොරතුරු ඉල්ලීම වන ඉහත සඳහන් 2022.01.18 දිනැති තොරතුරු ඉල්ලීමට අදාළව තොරතුරු සැපයීමක් සිදු කර නොමැත. එසේම එම තොරතුරු මුදා නොහැරීමට තොරතුරු පනතේ 5 (1) වගන්තියේ විධිවිධාන අදාළ කර ගත හැකි බවට කරුණු අනාවරණය නොවේ.

එබැවින් මෙම කරුණු සළකා බලා අභියාචක විසින් ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමෙන් ඉල්ලා ඇති සියලුම තොරතුරු 2022.11.24 දිනට ප්‍රථම, මෙම කොමිෂන් සභාවට පිටපත් සහිතව අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

කොමිෂන් සභාවේ මෙම තීරණයට අනුකූලව ක්‍රියා කිරීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම්, තොරතුරු නිලධාරිට සහ පොදු අධිකාරියට එරෙහිව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව නියමිත මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු පැවරීමට ක්‍රියාකළ යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය වෙත, තොරතුරු නිලධාරි වෙත සහ අභියාචක වෙත දන්වා යැවීමට  කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

මෙම අභියාචනය අවසන් කරනු ලැබේ.